*සියලුම හිමිකම් ඇවිරිණි*
*All Rights Reserved*

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# අනාවරණ පරීක්ෂණය 2021

**06 ශ්‍රේණිය** **ක්‍රිස්තු ධර්මය** **කාලය පැය 02 යි**

| නම/ විභාග අංකයඃ |
|---|

**I කොටස**

- **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. මැවීම පිළිබඳ කතාව සඳහන් ව ඇත්තේ ශුද්ධ බයිබලයේ

(1) නික්මයාම පොතේ ය. (2) ශු. ලූක් පොතේ ය.

(3) උත්පත්ති පොතේ ය. (4) ජෙරමියා පොතේ ය.

02. මරිය තුමියට ජේසු තුමාගේ උපත පිළිබඳව දැනුම් දුන්නේ

(1) ගාබ්‍රියෙල් දේවදූතයා ය. (2) පිලාත් රජතුමා ය.

(3) සෙකරියස් තුමා ය. (4) පේදුරු තුමා ය.

03. ළදරු ජේසු තුමා මරිය තුමි හා ජෝසෙප් තුමා සමඟ ජෙරුසලම් දේව මාළිගාවට ගියේ

(1) පෙරහැරක් නැරඹීමට ය. (2) නාට්‍යයක් නැරඹීමට ය.

(3) දේශනයක් ඇසීමට ය. (4) ජුදෙව් පාස්කු මංගල්‍යයට සහභාගීවීමටය.

04. පාපය යනු,

(1) අප දෙවියන් වහන්සේගේ කැමැත්තට පිටු පා ක්‍රියා කිරීම ය.

(2) බොරු කේලාම් කීම ය.

(3) සොරකම් කිරීම ය.

(4) රණ්ඩු සරුවල් කිරීමය.

05. ජේසුස් වහන්සේ බෞතීස්ම ස්නාපනය ලැබුවේ

(1) පේදුරුතුමා අතින් ය. (2) ජුදස් තුමා අතින් ය.

(3) ස්නාවක ජොහාන් තුමා අතින්ය. (4) සෙකරියස් තුමා අතින්ය.

- **A කොටසේ අදාළ ප්‍රශ්නයට ගැළපෙන පිළිතුර B කොටසින් තෝරා යා කරන්න.**

| A | B |
|---|---|
| 06. ජේසුතුමාට පැමිණි පරීක්ෂා ගණන | ජෙස්සේ |
| 07. පංච පුස්තකයට අයත් පොත් ගණන | හැට හයකි |
| 08. ජේසුතුමා පාවා දුන් ගෝලයා | තුනකි |
| 09. දාවිත්ගේ පියාගේ නම | ජූදස් |
| 10. ශුද්ධ බයිබලයේ පොත් ගණන | පහකි |

- **පහත දැක්වෙන ප්‍රකාශ නිවැරදි නම් (✓) ලකුණ ද, වැරදි නම් (X) ලකුණ ද යොදන්න.**

11. සූර්යයා, චන්ද්‍රයා, තාරකා මැව්වවේ හතරවන දිනයේ ය. (     )

12. දේව මැවිල්ල සුරැකීම අපි සතු වගකීමක් නොවේ. (     )

13. ජේසුස් වහන්සේ බෞතීස්මය ලැබුවේ ජෝර්දාන් ගඟේ ය. (     )

14. ජෙරුසලම් සභාවේ නායකයා වූයේ සීමොන් පේදුරු තුමාය. (     )

15. අප අපේ අසල්වැසියාට ප්‍රේම නොකරමු. (     )

- **අංක 16 සිට 20 දක්වා ප්‍රකාශවල දැක්වෙන ප්‍රකාශ වල හිස්තැන තුලදී ඇති පිළිතුරු යොදා ගනිමින් සම්පූර්ණ කරන්න.**

ගොල් ගොතා / පොත් / සුවය / නිහතමානි / සාමුවෙල්

16. .................................................................. නමේ අරුත දෙවියන් වහන්සේගෙන් ඉල්ලා ගත් යන්නයි.

17. ඇදහිල්ලෙන් අපට ........................................................................................................ ලැබේ.

18. කිතුනු දරුවන් ලෙස අපි සැමවිටම ........................................................................................ වෙමු.

19. ජේසුස් වහන්සේ කුරුසිය උසුලාගෙන ගියේ .......................................................... නම් ස්ථානයට ය.

20. ''බිබ්ලියොන්'' යන ග්‍රීක වචනයේ අර්ථය ............................................................................ යන්නයි.

(ල. 2x20 = 40)

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.**

01. (i) මිනිසා මවනු ලැබුවේ කී වෙනි දිනයේ ද? මිනිසා මැව්වේ කුමන ස්වරූපයට අනුව ද?

(ii) මිනිසා දේව මැවිල්ල විනාශ කරන ආකාර 02 ක් ලියන්න.

(iii) දේව සබඳතාවය වර්ධනය කර ගැනීමට ඔබ තුළ තිබිය යුතු ගුණාංග 02 ක් ලියන්න.

(iv) ශාස්ත්‍රවන්තයින් ජේසු බිළිඳා නැමදීමට රැගෙන ආ දේවල් 02 ක් ලියන්න.

(v) ජේසුස් වහන්සේට කුරුසිය රැගෙන යාමට උදව් කළේ කවුද?

(vi) ජේසුස් වහන්සේගේ උත්ථානයේ සුපුවත මුලින් ම දැන ගත්තේ කවුද? ඉන් එක් අයෙකුගේ නම ලියන්න.

(vii) ශුද්ධ බයිබලය බෙදෙන ප්‍රධාන කොටස් 02 ක ලියන්න.

(viii) පංච පුස්තකයට අයත් පොත් 02 ක් නම් කරන්න. (ල. 2 x 8 = 16)

02. (i) ජුදෙව් පාස්කු මංගල්‍යය මගින් සමරනු ලැබුවේ කුමක්ද? (ල. 02)

(ii) ''ඔබ මා සෙව්වේ මන්ද? මා පියාණන්ගේ මැදුරේ සිටිය යුතු බව ඔබ නොදන්නෙහිද?
මෙසේ කීවේ කවුද? කාටද? කුමන අවස්ථාවේද? (ල. 03)

(iii) කිතුනු දරුවෙකු ලෙස ඔබ තුළ තිබිය යුතු ගුණාංග 06 ක් ලියන්න. (ල. 06)

03. (i) ජේසුස් වහන්සේට පැමිණි පරීක්ෂාවන් 02 ක් ලියන්න. (ල. 02)

(ii) අද ඔබට එල්ල වන පරීක්ෂාවන් 03 ක් ලියන්න. (ල. 03)

(iii) ස්වාමීන්ගේ යාච්ඤාව තුළ අප පරීක්ෂාවෙන් මිදීම සඳහා කෙරෙන ඉල්ලීම සඳහන් වන්නේ කෙසේදැයි ලියන්න. (ල. 06)

04. (i) සුවය පතා ජේසු තුමා ළඟට පැමිණි ලාදුරු රෝගීන් ගණන කීය ද? ඉන් තුති පිදීම පිණිස සුවය ලැබීමෙන් පසු පැමිණි රෝගීන් ගණන කීයද? (ල. 02)

(ii) එදා ජුදෙව් සමාජයේ කොන් කරනු ලැබූ ජන කණ්ඩායම් 03 ක් නම් කරන්න. (ල. 03)

(iii) ඔබේ ජීවිතයේ දෙවියන් වහන්සේට විශේෂයෙන් ස්තුති කළ අවස්ථා 03 ක් ලියන්න. (ල. 06)

05. (i) මුලින් ම දේව වචනය ලියවී තිබූ දේවල් 02 ක් ලියන්න. (ල. 02)

(ii) බයිබලය පුස්තකාලයක් ලෙස හඳුන්වන්නේ කුමක් නිසා ද? (ල. 03)

(iii) ''අප එකිනෙකා සමඟ යහපත් ජීවිතයක් ගත කිරීමට දස පණත මගින් මහත් පිටුවහලක් ලැබේ.'දස පණතේ සඳහන් පණත් 03 ක් ලියන්න. (ල. 06)

06. (i) දාවිත් තුළ තිබුණා වූ දක්ෂතා 02 ක් ලියන්න. (ල. 02)

(ii) දාවිත් පරාජයට පත් කළ පිලිස්තිය ජාතිකයා කවුද? ඔහු මරණයට පත් කළේ කෙසේ ද? ඒ සඳහා දාවිත් තුළ තිබූ විශ්වාසය පැවතුණේ කා සමඟද? (ල. 03)

(iii) කිතුනු දරුවෙකු ලෙස ඔබ දෙවියන් වහන්සේ සමඟ විශ්වාසයෙන් කටයුතු කළ අවස්ථා 03 ක් ලියන්න. (ල. 06)

## පිළිතුරු පත්‍රය - I කොටස

01. (3) 02. (1) 03. (4) 04. (1) 05. (3) 06. තුනකි 07. පහකි 08. ජූදස් 09. ජෙස්සේ 10. හැට හයකි
11. (✓) 12. (X) 13. (✓) 14. (✓) 15. (X)
16. සාමුවෙල් 17. සුවය 18. නිහතමානි 19. ගොල්ගොතා 20. පොත්

## II කොටස

01. (i) හයවන දිනයේ ය. දෙවියන් වහන්සේගේ ස්වරූපයට අනුව
(ii) * වනාන්තර වල ගස් කැපීම. * පොලිතීන් භාවිතය
* ජලයට කැළි කසල බැහැර කිරීම. * වායු දූෂණය
* පරිසර දූෂණය
(iii) දයාව/ ඉවසීම/ කමාව/ එකමුතුකම/ ආදරය/ බෙදා ගැනීම/ කරුණාව .....
(iv) රන්තරන් / තුවරලා / ගන්ධරස
(v) කිරේනියේ සීමොන්
(vi) කාන්තාවන් - මග්දලායේ මරියා / මරියා / ජෝවන්නා
(vii) පුරාණ ගිවිසුම / නව ගිවිසුම
(viii) උත්පත්ති / නික්මයාම / ලෙවී ව්‍යවස්ථාව/ ගණන් කතාව/ ද්විතීය නීති සංග්‍රහය (ල. 2 x 8 = 16)

02. (i) ඊශ්‍රායෙල් ජනතාව මිසරයේ වහල්කමෙන් මුදවා ගෙන පැමිණීම. (ල. 02)
(ii) ජේසුස් වහන්සේ විසින් මරිය තුමියට ජේසුතුමා සොයා මරිය තුමී හා ජෝසෙප් තුමා යෙරුසලම් දේව මාලිගාවට පැමිණි අවස්ථාවේ (ල. 03)
(iii) ඉවසීම/ කරුණාව/ ප්‍රේමය/ සාමය/ බෙදාගැනීම/ සහෝදරත්වය/ එකමුතුකම/ ආදරය .... (ල. 06)

03. (i) * ඔබ දේව පුත්‍රයා නම් ගල් ගෙඩිය පාන් ගෙඩියන් වන්නට අණ කළ මැනව.
* ලෝකයේ ඇති සියළු දේ ඔබට දෙමි. මා ඉදිරියේ නමස්කාර කරන්න.
* ඔබ දේව පුත්‍රයා නම් දේව මාළිගාවේ කොත මුදුනින් පහතට පනින්න. (ල. 02)
(ii) සොරකම් කිරීම/ බොරු කීම/ පන්ති මඟ හැරීම / දුරකථනයෙන් අසභ්‍ය දර්ශන බැලීම ..... (ල. 03)
(iii) අප පරීක්ෂාවට නොපමුණුවා නපුරෙන් අප ගළවා ගත මැනව. (ල. 06)

04. (i) දහයයි. එක්කෙනයි. (ල. 02)
(ii) කාන්තාවන්/ රෝගීන්/ ළඳරුවන්/ අයකැමියන්/ සමාරිතයන් (ල. 03)
(iii) ලියා ඇති පිළිතුරට ලකුණු ලබා දෙන්න. (ල. 06)

05. (i) පැපිරස් පත් වල/ සතුන්ගේ හම වල/ ගල් පුවරු වල (ල. 02)
(ii) බයිබලයේ පොත් හැට හයකින් සමන්විත වීම නිසා හා කතුවරුන් රාශියක් විසින් එම පොත් ලියා ඇති නිසා (ල. 03)
(iii) 6 ශ්‍රේණියේ ක්‍රිස්තියානි පෙළපොතේ 84 පුටිවේ ඇති දස පණතෙන් 06 ක් ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල. 06)

06. (i) වීණා වාදනය / ගල් පටියෙන් ඉලක්කයට විදීම (ල. 02)
(ii) ගොලියත්/ ගල් පටියෙන් විද/ දෙවියන්වහන්සේ සමඟ (ල. 03)
(iii) ලියා ඇති පිළිතුරු වලට ලකුණු ලබා දෙන්න. (ල. 06)